**ශීර්ෂය 117 - උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 117 - උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 දෙසැම්බර් 12 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**2.1.1 මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 182,198.69 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 152,505.02 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 29,693.67 ක් හෙවත් සියයට 16.30 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 4,464.69 | 3,417.95 | 1,046.74 | 23.44 |
| මූලධන | 177,734.00 | 149,087.07 | 28,646.93 | 16.12 |
| **එකතුව** | **182,198.69** | **152,505.02** | **29,693.67** | **16.30** |

**2.1.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශය වෙත වෙනත් අමාත්‍යාංශ 03ක් විසින් රු.මිලියන 752.31 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 98.93 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 653.38 ක් හෙවත් සියයට 86.85 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ප්‍රතිපාදන සලසා දුන් අමාත්‍යාංශය** | **2016 දෙසැම්බර් 31දිනට** | | |
|---|---|---|---|
| | **ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | 402.31 | 98.93 | 303.38 |
| ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 200.00 | - | 200.00 |
| බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 150.00 | - | 150.00 |
| **එකතුව** | **752.31** | **98.93** | **653.38** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 11701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 18.00 | 16.66 | 8.00 | 9.29 | 70.00 | 37.83 |

**2.3 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශය යටතේ වු අග්‍රිම ගිණුම් 02 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 15.69 ක් විය. විස්තර පහත දැක්වේ.

| අග්‍රිම ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 7003/0000/00/0054/0016/000 | 15.67 |
| 7002/0000/00/0332/0016/000 | 0.02 |
| **එකතුව** | **15.69** |

**2.4 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය යටතේ වූ තැන්පත් ගිණුම් 06 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 624.20 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0002/0176/000 | 0.09 |
| 6000/0000/00/0013/0135/000 | 168.03 |
| 6000/0000/00/0016/0123/000 | 391.79 |
| 6000/0000/00/0017/0033/000 | 22.48 |
| 6000/0000/00/0018/0114/000 | 0.31 |
| 6000/0000/00/0020/0021/000 | 41.50 |
| **එකතුව** | **624.20** |

**2.5 විගණන නිරීක්ෂණය**

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, තවත් ලේඛන දෙකක් විධිමත්ව හා යාවත්කාලීනව කර පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | උසස් අධ්‍යාපන අංශයේ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| (ඇ) | විසර්ජන සම්මත වැය ලෙජරය | මුදල් රෙගුලාසි 447(5) | මහාමාර්ග අංශයේ විසර්ජන වැය ලෙජරය යාවත්කාලීන කර නොතිබුණි. |

## 3.2 විගණන සාක්ෂි ඉදිරිපත් නොකිරීම

2016 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුම අනුව වැය විෂයයන් 45 කට සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු එකතුව රු.මිලියන 9,148 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් වන පරිදි අග්‍රිම ලබා නොදීම නිසා එම ඉතිරියන් සිදු වූ බව විගණනය ඉදිරිපත් කළ විසර්ජන ගිණුමේ හේතු වශයෙන් දක්වා තිබුණි. නමුත් 2015 දෙසැම්බර් 14 දිනැති අංක 08/2015 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කරන ලද අග්‍රිම අවශ්‍යතා ලේඛනය විගණනයට ඉදිරිපත් කර නොතිබීම නිසා විසර්ජන ගිණුමේ සඳහන් කර තිබුණු හේතුවල නිවැරදිභාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

## 3.3 විසර්ජන ගිණුම

### අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උසස් අධ්‍යාපන අංශයේ වැය විෂයයන් 54 ක් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සලසා තිබුණු එකතුව රු.මිලියන 88.15 කින් සමාලෝචිත වර්ෂයේදී කිසිදු උපයෝජනයක් සිදු නොකිරීම නිසා එම ප්‍රතිපාදනය මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(ආ) අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය විසින් වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ඉල්ලුම් කර නොතිබුණත්, වැය විෂයයන් 3 ක් යටතේ එකතුව රු.මිලියන 305 ක ප්‍රතිපාදන වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ සඳහන් කර තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 83 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ඇ) අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය විසින් වැය විෂයයන් 03 ක් වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් එකතුව රු.මිලියන 704.4 ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි. නමුත්

පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ප්‍රතිපාදන ලබා ගැනීමේදී සඳහන් කර තිබුණු කාර්යයන් සඳහා එම ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය යටතේ වන වැය විෂයන් 19 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදනයන්ගෙන් උපයෝජනය කළ පසු ඉතිරිය සියයට 25 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවලට හා දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කර තිබුණු යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.මිලියන 2,991 ක ප්‍රතිපාදන සලසා තිබුණි. කොන්ත්‍රාත් ප්‍රදානයන් ප්‍රමාද කිරීම, කොන්ත්‍රාත්කරුවන් විසින් කාර්යයන් ඉටු කිරීම ප්‍රමාද කිරීම, අමුද්‍රව්‍ය සපයාගැනීම ප්‍රමාද කිරීම හා උපදේශකවරුන් වෙනස්වීම් වැනි ව්‍යාපෘති කළමනාකරණ දුර්වලතා හේතුවෙන් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2016 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 1,035,571 ක් වූ අතර, එම හිඟහිටි ණයශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 26 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ආ) මහාමාර්ග අංශයේ CC - 10 ලේඛන විධිමත් පරිදි යාවත්කාලීන නොකිරීම නිසා සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණු ණය ශේෂවල නිවැරදිභාවය තහවුරු කරගැනීමට නොහැකි විය.

## 3.5 තැන්පත් ගිණුම

---

අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුම්වල වර්ෂ 2 කට වැඩි කාලයක් ඉක්මවූ වූ රු.මිලියන 54.7 ක තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---

### 3.6.1 අභ්‍යන්තර විගණනය

---

අභ්‍යන්තර විගණන සැලැසුම් මගින් අනුකූලතා පරීක්ෂාවන් කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. අභ්‍යන්තර විගණන විෂය පථයට අදාළ නොවන විෂය ක්ෂේත්‍ර අභ්‍යන්තර විගණන සැලසුමට ඇතුළත් කර තිබුණු බව නිරීක්ෂණය විය.

**3.6.2 විගණන හා කළමනාකරණ කමිටුව**

විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම්වලදී සාකච්ඡා කෙරෙන කරුණුවල ප්‍රගතිය තහවුරු කර ගැනීමට හැකි වන පරිදි සාරාංශගත වාර්තාවක් පිළියෙල කර ඉටුකළ යුතු කාර්යයන් අදාළ වගකිව යුතු නිළධාරීන්ට පැවරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3.6.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2017 දෙසැම්බර් 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) විසර්ජන ගිණුමේ වත්කම්වල වටිනාකම**

විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් පිළිබඳ සංචලන වාර්තාවේ ආරම්භක ශේෂය තුළ අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය සතු රු.මිලියන 15.14 ක් වටිනා යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණවල වටිනාකම දෙවරක් සටහන් කර තිබුණි. මේ නිසා විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවේ දක්වා තිබුණු වටිනාකම ඉහත ප්‍රමාණයෙන් වැඩියෙන් සටහන් කර තිබුණි.

**(ආ) ප්‍රතිස්ථාපනය කිරීමේ පදනම යටතේ ලබාදුන් වාහන ආපසු භාර නොදීම**

කලින් භාවිතා කළ වාහනය මුදල් අමාත්‍යාංශය වෙත භාරදීමේ පදනම මත මහාමාර්ග රාජ්‍ය අමාත්‍යවරයාට වාහනයක් මිලදී ගැනිම සඳහා ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 32.81 කට වාහනයක් මිලදී ගෙන තිබුණු අතර, 2017 දෙසැම්බර් 12 දින වන විටත් කලින් පාවිච්චි කළ වාහනය මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයට භාර දී නොතිබුණි.

**(ඇ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**මහාමාර්ග අංශය**

2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර එම වාර්තා 2017 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. මේ අනුව විසර්ජන ගිණුමේ සටහන (i) හි දක්වා තිබුණු වත්කම්වල ශුද්ධ ශේෂය

ස්ථාවර වත්කම් ලේඛනයේ අගයන් සමඟ සසඳා නොතිබුණි. එමෙන්ම වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මඟින් වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කර නොතිබුණි.

**උසස් අධ්‍යාපන අංශය**

**------------------------**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදුකර එම වාර්තා 2017 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ඈ) වත්කම් ලේඛන පවත්වාගෙන යාම හා වත්කම් පවරා ගැනීම**

**-------------------------------------------------------------------**

අමාත්‍යාංශය විසින් නේවාසිකාගාර ව්‍යාපෘතිය යටතේ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන 19 ක රු.මිලියන 11,681.85 ක් වැය කර ඉදිකර තිබුණු නේවාසිකාගාර ගොඩනැගිලි 45 ක් එම විශ්වවිද්‍යාල ආයතනවල ගිණුම්වලට මාරු කර තිබුණත්, එම ගොඩනැගිලි විශ්වවිද්‍යාල වෙත ලිඛිතව පවරා දී නොතිබුණි.

**(ඉ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**--------------------------------------------**

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සතු වාහන දෙකක් වෙනත් ආයතනවලට මුදාහැර තිබූ අතර එම වාහන විධිමත් ලෙස පවරාදීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. එසේම මෙකී වාහනවල වටිනාකම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඊ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

**------------------------------------------------------------**

මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලබාගත් තොරතුරු අනුව අමාත්‍යාංශයේ වාහන 09 ක් මහාමාර්ග අංශයට මුදාහැර තිබුණද, එම වාහන 2017 සැප්තැම්බර් 06 දින වන විටත් නැවත ආපසු භාරදී නොතිබුණි. එසේම අමාත්‍යාංශය විසින් ලබාදුන් තොරතුරුවලට අනුව එක් වාහනයක් පමණක් අධිකාරියෙන් ලබාගත් බවට විස්තර දක්වා තිබුණද, අදාළ වාහන භාරගැනීම හා භාරදීම පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(උ) බේරුම් නොකළ බැරකම්**

**------------------------------**

අමාත්‍යාංශය විසින් 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් ප්‍රමාණය රු.මිලියන 25,268.26 ක් වූ අතර, ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි අංක 94 ට පටහැනිව වැය විෂයයන් 57 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.මිලියන 14,612.18 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

(ii) උසස් අධ්‍යාපන අංශයේ සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.29,534,769 ක් වටිනා බැරකම් ප්‍රමාණයක් විසර්ජන ගිණුමේ අඩුවෙන් දක්වා තිබුණි.

(iii) 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ප්‍රතිපාදන සලසා නොතිබුණු වැය විෂයයන් 06 ක් යටතේ එළඹ තිබුණු රු.මිලියන 1,426 ක් වූ බැරකම්, බැරකම් ලේඛනයේ සටහන් කර නොතිබුණි.

(iv) අමාත්‍යාංශය යටතේ පවතින විවිධ විදේශාධාර ව්‍යාපෘති 11 ක සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව හෙළිදරව් කර තිබුණු බැරකම් ප්‍රමාණය හා විසර්ජන ගිණුමේ අදාළ ව්‍යාපෘති යටතේ සඳහන් කර තිබුණු බැරකම් වටිනාකම අතර රු.මිලියන 20,596 ක වෙනසක් නිරීක්ෂණය විය.

(v) සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය හා පෞද්ගලික ආයතන 13 කට ගෙවිය යුතු නිශ්චිත වශයෙන් වැය විෂය හඳුනා නොගත් බැරකම්වල වටිනාකම රු.මිලියන 1,986.14 ක් විය.

## 3.8 අනුකූල නොවීම්

### (අ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| **(i) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනතට අදාළ 2015 ජූලි 05 දිනැති අංක SEC/2015/05 දරන දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | 500,000 | උපයන විට ගෙවීමේ බදු අදාළ සේවාදායකයා විසින් ගෙවිය යුතුව තිබුණද, උතුරු මාර්ග සම්බන්ධීකරණ ව්‍යාපෘතියේ උපදේශකවරුන්ගේ උපයන විට ගෙවීමේ බදු ව්‍යාපෘතිය විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| **(ii) භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | - | I-Road ව්‍යාපෘතිය විසින් රු.මිලියන 13.31 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කර තිබුණු භූගෝලීය තොරතුරු පද්ධති මෘදුකාංගයක් පරිගණක හා මෘදුකාංග ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. |

**(iii) ජාතික අයවැය චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2015 දෙසැම්බර් 29 දිනැති අංක 7/2015 දරන චක්‍රලේඛයේ 2 ඡේදය | - | 1202 - ඉන්ධන වැය විෂය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 15ක අනිවාර්ය ඉතිරිකිරීමක් කළ යුතු වුවත්, මහාමාර්ග අංශය විසින් එසේ සිදුකර නොතිබුණි. |

**(iv) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2017 ඔක්තෝබර් 17 දිනැති අංක 251/2016 දරන චක්‍රලේඛයේ 3.11 ඡේදය | 3,571,573,161 | චක්‍රලේඛය ප්‍රකාර 2016 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයට වාර්තා කර තිබූ බැරකම් හා විසර්ජන ගිණුමේ දක්වා තිබූ බැරකම් අතර වෙනසක් පැවැතුණි. |

**(v) කළමනාකරණ සේවා චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2006 මාර්තු 24 දිනැති අංක 1/2006 දරන චක්‍රලේඛය | - | I-Road ව්‍යාපෘතිය සඳහා එක් අයෙකුට රු.60,000 ක මාසික දීමනාවක් ගෙවමින් ආධුනිකත්ව පදනම මත ඉංජිනේරුවන් 05 ක් බඳවා ගෙන තිබුණි. |

**(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය විසින් රු.මිලියන 7.92 ක එකතු කළ අගය මත බදු ගෙවා තිබුණි. එම බදු පිළිබඳ වාර්තාව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය ප්‍රකාරව, එළඹෙන මාසයේ 15 දිනයට පෙර විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යවා නොතිබුණි.

## 3.9 විදේශාධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මූල්‍යාණය යටතේ ව්‍යාපෘති 51 ක් ක්‍රියාත්මක කර තිබුණි. ණය ගිවිසුම් අනුව එහි ඇස්තමේන්තුගත පිරිවැයවල එකතුව රු.බිලියන 1,140 ක් විය. එම ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.බිලියන 105 ක් උපයෝජනය කර තිබුණි. තවද, ව්‍යාපෘති 09 ක් වෙනුවෙන් 2017 දෙසැම්බර් මාසය වන විටත් ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කර තිබුණද, ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. මෙම විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** i-Road ව්‍යාපෘතියේ මූලික ක්‍රියාකාරී සැලැස්ම අනුව, දකුණු, සබරගමුව, මධ්‍යම, උතුරු මැද, වයඹ පළාත්වල සහ බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කිලෝමීටර් 3,135.5 කින් යුතු පළාත් හා ග්‍රාමීය මාර්ග වැඩ 742 ක් ආරම්භ කිරීමට අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘතිය මඟින් ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් පැකේජ 42 කින් පැකේජ 15 ක 2016 දෙසැම්බර් 31 දින වන විට කාර්යසාධනය අපේක්ෂිත ඉලක්කයන් කරා ළඟා වී නොතිබුණි. එසේම ක්ෂේත්‍ර පරීක්ෂාවට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් පැකේජ 02 යටතේ පළාත් හා ග්‍රාමීය මාර්ග 14 ක කිලෝමීටර් 92 කින්, කිලෝමීටර් 12.6 ක පමණක් පුනරුත්ථාපන වැඩ නිමකර තිබූ අතර කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාණවත් මානව හා භෞතික සම්පත් යෙදවීමේ අපහසුතාවයන් නිසා අදාළ කටයුතු මාස 11 කින් ප්‍රමාද කර තිබුණි.

**(ii)** අග්නිදිග විශ්වවිද්‍යාල සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් 09 ක් අතරින් ඉදිකිරීම් 05 ක 2016 දෙසැම්බර් 31 දින වන විට භෞතික ප්‍රගතිය ඉලක්කගත ප්‍රමාණයන් සමඟ සැසඳීමේදී සියයට 18 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයන්ගෙන් පැවතුණි.

**(iii)** 21 වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය (HETC) යටතේ දෙහිවල ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ඉදිකරනු ලබන ගුණාත්මක සංවර්ධන හා නායකත්ව මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා රු.මිලියන 80 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මෙම ගොඩනැගිල්ල 2015 වර්ෂයේ ආරම්භ කර 2016 මැයි මාසය වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. නමුත් 2016 ජූනි 30 දිනට එනම් ව්‍යාපෘතිය අවසන් වන දිනයට එම ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 60 ක් පමණක් වී තිබුණි. ව්‍යාපෘතිය සම්පූර්ණ පරිදි අවසන් නොකිරීම නිසා ව්‍යාපෘතිය වෙනුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු. මිලියන 19 ක් උපයෝජනය කිරිමට නොහැකි වී තිබුණි.

**(iv)** ඉහත ව්‍යාපෘතිය යටතේ ජාතික විශ්වවිද්‍යාල 13 ක සහ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන් 240 දෙනෙකු සඳහා දර්ශනපති, පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා රු.366,859,467 ක ප්‍රදාන ලබා දී තිබුණ ද, ව්‍යාපෘතිය අවසන් වන විටත් ප්‍රදානලාභීන්ගෙන් 30 දෙනෙකු පාඨමාලා සම්පූර්ණ කර නොතිබුණි.

**(ආ) විදේශාධාර ව්‍යාපෘතිවල ඇතුළත් සමහර කර්මාන්ත අතහැර දැමීම**

මඩකලපුව - තිරුක්කොණ්ඩායි ආරු -ත්‍රිකුණාමලය සහ අඹේපුස්ස - කුරුණෑගල - ත්‍රිකුණාමලය මාර්ග, ත්‍රිකුණාමලය නගරයෙන් පිටතට සම්බන්ධ වන සේ ඉදිකරන ලද පිටත වටරවුම් මාර්ගය සඳහා එක්සත් රාජධානි වානේ පාලම් ව්‍යාපෘතිය යටතේ 2009 සහ 2010 වර්ෂවලදී රු.මිලියන 3,495 ක් වැය කර පාලම් 08 ක් ඉදිකර තිබුණි. 2017 අගෝස්තු 31 දින වන විට ඒ සඳහා වර්ෂ 06 ක කාලයක් ගතවී තිබුණත්, එම පාලම් සම්බන්ධ කෙරෙන මාර්ග ඉදිකිරීමේ කාර්යයන් නිම කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) වාාපෘති අරමුදල් උපයෝජනය**

-----------------------------------

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව, 2016 දෙසැම්බර් 31 දිනට උපයෝජනය නොකළ ණය ශේෂ මත එ.ජ.ඩො.240,815 කට සමාන රු.මිලියන 34.88 ක කැපකරු ගාස්තු අයකර තිබුණි.

**(ඈ) වාාපෘතිය නියමිත දින ආරම්භ නොකිරීම**

---------------------------------------------

බස්නාහිර පළාතේ මාර්ග සංවර්ධන වාාපෘතියේ 2016 වර්ෂය අවසානයට සිවිල් සහ උපදේශක කොන්ත්‍රාත් කිසිවක් ප්‍රදානය කර නොතිබුණු බැවින් එම වාාපෘතියට අදාළ සැලසුම් සමග සැසඳීමේදී වාාපෘතියේ කටයුතුවල සැලකිය යුතු කාල ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

**(ඉ) වාාපෘතිය නිසා පරිසරයට වන බලපෑම**

--------------------------------------------

බස්නාහිර පළාතේ මාර්ග සංවර්ධන වාාපෘතියට අදාළ අනුමත පාරිසරික නිර්දේශයන් පිළිබඳ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඊ) සීමාව ඉක්මවා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවීම**

--------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** සමාලෝචිත වර්ෂයේදී දකුණ, සබරගමුව හා මධ්‍යම පළාත්වල මාර්ග පුනරුත්ථාපන කාර්යයන් භාරගෙන තිබුණු කොන්ත්‍රාත්කරුවන් වෙත රු.මිලියන 2,944.85 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණි. තාවකාලික කටයුතු සඳහා මුදල් වෙන්කිරීම් හා අසම්භාව්‍යයන්ද ඇතුළත් කොන්ත්‍රාත් වටිනාකම් මත අත්තිකාරම් ගණනය කිරීම හේතුවෙන් රු.මිලියන 508.15 ක් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(1) මාර්ගෝපදේශයට පටහැනිව වැඩිපුර ගෙවා තිබුණි. 2017 මාර්තු 31 දින වන විටත් වාාපෘතිය මඟින් වැඩිපුර ගෙවා තිබුණු අත්තිකාරම් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**(ii)** I-Road වාාපෘතිය මඟින් රත්නපුර දිස්ත්‍රික්කයේ පළාත් හා ග්‍රාමීය මාර්ග වැඩ භාරගෙන තිබුණු කොන්ත්‍රාත්කරු නව කාර්යාල උපකරණ ප්‍රසම්පාදනය කිරීමට කටයුතු සූදානම් කර රු.මිලියන 4.72 ක අත්තිකාරම් ගෙවා තිබුණි. එසේ වුවත්, උපදේශකවරයාගේ වාර්තාව අනුව, රේඛීය අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව අත්තිකාරම් ගෙවීමට හේතුවූ කරුණු සහ අත්තිකාරම් ගණනය කිරීමේ පදනම විගණනයට පැහැදිලි කර නොතිබුණි.

**(උ) කළමනාකරණ දුර්වලතා**

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිරීක්ෂණය විය.

**(i)** භෞතික හා මූල්‍ය ඉලක්ක ඇතුළත්ව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීම වාාපෘති

කළමනාකරණයේ වගකීමක් වුවද, I-Road ව්‍යාපෘතිය සඳහා එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. මේ නිසා ව්‍යාපෘතියේ අරමුණු කාර්යක්ෂමව හා සඵලදායීව ඉටුකර ගැනීම පිළිබඳව ඇගයීමට ලක්කිරීමට නොහැකි විය. එසේම අදාළ දත්ත විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එක් එක් පැකේජයන් යටතේ පළාත් මාර්ගවල පුනරුත්ථාපන කටයුතුවල භෞතික ප්‍රගතිය පරීක්ෂා කිරීමට නොහැකි විය.

**(ii)** I-Road ව්‍යාපෘතියේ උපදේශන පැකේජ ගිවිසුමේ 20 වන උපවගන්තිය අනුව, දැනුම හුවමාරු කිරීමේ අරමුණු සඳහා සබරගමුව, මධ්‍යම හා බස්නාහිර පළාත්වල මාර්ග සංවර්ධන අධිකාරියේ හා පළාත් සභාවල ඉංජිනේරුවරුන් හා කාර්මික නිලධාරීන් කොන්ත්‍රාත් කටයුතු සඳහා අනුයුක්ත කිරීමට සැලැසුම් කර තිබුණද, ව්‍යාපෘතිය විසින් එසේ කටයුතු කර නොතිබුණි.

**(iii)** මාර්ග සංවර්ධන අධිකාරියට අදාළ නොවන මාර්ග පුළුල් කිරීම් හා පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමකින් තොරව ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කර තිබුණද, ඒ සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(iv)** මහනැගුම මහමැදුර ඉදිකිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- 2010 අගෝස්තු 17 දින රු.මිලියන 599.3 කට පිරිනමන ලද මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් කාර්යාලය ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව විධිමත් මූල්‍ය හා භෞතික සැලැසුම්වලින් තොරව ආරම්භ කර තිබුණු නිසා එහි පිරිවැය රු.මිලියන 2,506.54 ක් දක්වා ඉහළ අගයක් ගෙන තිබුණි.

- භෞතික සැලැසුම් වෙනස් කර එකම කොන්ත්‍රාත්කරුට ඉහළ පිරිවැයකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු අතර ගොඩනැගිල්ලේ අදියර - III කොටස ඉදිකිරීමේදී ගිවිසුම්ගත රේටයන් සියයට 13 ක සිට සියයට 68 ක් දක්වා පරාසයක ප්‍රමාණවලින් විචලනය වී තිබුණු බැවින් රු.මිලියන 495.39 ක් විචලතා නියෝග ඉදිරිපත් කර තිබුණි. එම විචලතා නියෝග මතද පොදුකාර්ය වියදම් සඳහා සියයට 35 ක අතිරේක ගාස්තුවක් අයකිරීමට කොන්ත්‍රාත්කරුට ඉඩ සලසා දී තිබුණි.

- කොන්ත්‍රාත් ගිවිසුමේ 14.10 වගන්තිය ප්‍රකාර වැඩ සම්පූර්ණ කිරීමේ සහතිකය 2016 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. එසේ වුවත් රු. මිලියන 2,057 ක අගයක් සඳහා අවසාන බිල්පත් ඉදිරිපත් කර තිබුණි.

- ගොඩනැගිල්ලේ අභ්‍යන්තර ව්‍යුහය සැලැසුම් කිරීමේ කටයුතු සඳහා උපදේශක සමාගමට රු.මිලියන 21.03 ක් 2015 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබුණද ගිවිසුම් ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු අවශ්‍ය අභ්‍යන්තර ව්‍යුහයේ සැලැසුම් සහ අවශ්‍ය වන විස්තර (drawing) ඉදිරිපත් කර නොතිබුණි.

- 2015 පෙබරවාරි 17 දින ගොඩනැගිල්ලට අවශ්‍ය ලීබඩු උපකරණ රු.මිලියන 87.13 කට මිලදී ගැනීම සඳහා ගිවිසුමකට එළඹ තිබුණද, අභ්‍යන්තර ව්‍යුහයේ සැලැසුම් ඉදිරිපත් නොකිරීම නිසා 2016 අප්‍රේල් 30 දින වන විටත් එකී ගිවිසුම අනුව සැපයීම් කටයුතු අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

- ලීබඩු සැපයීම වෙනුවෙන් රු.මිලියන 26.73 ක සහ 6 වන මහලේ සිවිලිම සඳහා රු.මිලියන 39.63 ක විචලතා සහතික ඉදිරිපත් කර තිබුණි. ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 මාර්ගෝපදේශයට

පටහැනිව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ඒ සඳහා ගෙවීම් සිදුකර තිබුණි.

**(v)** හැටන් - නුවරඑළිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2016 නොවැම්බර් 25 දින අවසන් කර තිබුණි. නමුත් ව්‍යාපෘතිය අවසන් කිරීමේ වාර්තාව 2017 ජූනි මාසය අවසන් වන විටත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(vi)** බදුල්ල වෙන්කලාඩි -මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රගතිය 2017 ජූනි 14 දින වන විට අපේක්ෂිත ඉලක්ක සමඟ සැසඳීමේදී සියයට 33 ක සිට සියයට 50 ක් පරාසයක ප්‍රමාණයක පහළ මට්ටමක පැවති අතර සමස්ථ ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතුවල කාර්යසාධනයද පහළ මට්ටමක පැවතුණි.
- මහජන උපයෝගීතා සේවාවන් සම්බන්ධයෙන් කරනු ලබන වෙනස්කිරීම් සහ ඉදිකිරීම් වෙනුවෙන් අත්තිකාරම් ලෙස රු. 689,053,711 ක් ගෙවා තිබුණද ඒ සම්බන්ධ කිසිඳු ගිවිසුමකට එළඹ නොතිබුණි.
- ඔපෙක් සංවර්ධන අරමුදලින් (OFID) හා සවුදි සංවර්ධන අරමුදලින් (SFD) ලද අරමුදල්වලට අමතරව රු.2,538,312 ක අත්තිකාරම් ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ණය වශයෙන් ලබාගෙන තිබුණද, ඒ සඳහා ලබා ගත් අනුමැතිය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(vii)** ඒකාබද්ධ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය විසින් විධිමත් බඳවා ගැනීමේ පටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව උපදේශකවරුන් 11 දෙනෙකු හා මහජන සම්බන්ධතා නිලධාරීන් 03 දෙනෙකු බඳවාගෙන තිබුණි. මෙම නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 4.50 ක මාසික දීමනා හා වාහන කුළී ගාස්තු ලෙස ගෙවා තිබුණි. නමුත් එම නිලධාරීන්ට පවරන ලද කාර්යයන් පැමිණීමේ වාර්තා සහ කළ වැඩ පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(viii)** කොළඹ - කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය යටතේ මිලදී ගෙන තිබුණු රු.මිලියන 117.82 ක් වටිනා වාහන 13 ක් ව්‍යාපෘතිය අවසානයේදී මාර්ග සංවර්ධන අධිකාරියට භාරදිය යුතුව තිබුණි. නමුත් එසේ නොකර, ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් කිසිඳු පදනමකින් හා ගාස්තු අය කිරීමකින් තොරව පිටත වටරවුම් මාර්ගය - III (කඩවත සිට කෙරවලපිටිය දක්වා කොටස) (OCHP – III) ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු වෙත ලබාදී තිබුණි.

**(ix)** මාතර - ගොඩගම මාර්ගය ඉදිකිරීමට අදාළව මූලික ප්‍රමාණ පත්‍රවල ඇතුළත්ව තිබුණු රු.මිලියන 161.33 ක් වටිනා වැඩ අයිතම 214 ක් එනම් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 29.09 ක වැඩ කොටස් ප්‍රමාණයක් ඉවත් කර තිබුණි. මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20.5 ක් වූ රු.මිලියන 116.57 ක වැඩ ප්‍රමාණයක් අළුතින් එකතු කර තිබුණි. අළුත්ගම සිට දකුණු අධිවේගී මාර්ගය දක්වා මාර්ගය ඉදිකිරීමට අදාළ කොන්ත්‍රාත්තුවේ රු.මිලියන 737.64 ක් වටිනා අයිතම 326 ක වැඩ කොටස් ඉවත් කර තිබුණි.

**(x)** මහාමාර්ග අමාත්‍යාංශය විසින් මුදල් ගෙවීමෙන් හෝ බැඳුම්කර නිකුත් කිරීමෙන් 2010 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ අත්සන් කර තිබුණු ඉඩම්වලට

අදාළව පැහැදිලි වත්කම් වාර්තාවක් (ලෙජරය) යාවත්කාලීන කර නොතිබුණි. උදාහරණයක් වශයෙන් පිටත වටරවුම් මහාමාර්ග අදියර - II යටතේ වන්දි ගෙවා අත්පත් කරගත් ඉඩම් කොටස් 1,205 කින් ඉඩම් කොටස් 614 ක් පමණක් 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ (සංශෝධන) පනතේ 44 වගන්තිය යටතේ පවරා ගැනීමට කටයුතු කර තිබුණි. තවද, අමාත්‍යාංශයේ මැදිහත්වීමක් නොමැතිව ව්‍යාපෘති මඟින් අත්පත් කරගනු ලබන ඉඩම් පිළිබඳ විස්තර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එසේම බැඳුම්කර මඟින් අත්පත් කරගත් ඉඩම් පිළිබඳ විස්තරද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(xi) දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය**

----------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මොරටුව විශ්වවිද්‍යාලය මඟින් කරන ලද තාක්ෂණික විගණනයට අනුව ව්‍යාපෘතිය ශක්‍යතාවයෙන් යුතු ව්‍යාපෘතියක් වීම සඳහා ආර්ථික අභ්‍යන්තර එලදා අනුපාතය (EIRR) සෘණ 11.1 ක් විය යුතු බව අවධාරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් ව්යාපෘතියේ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදුකර නොතිබුණු අතර ණය ලබාගැනීමට අදාළ සාකච්ඡා සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 මාර්ගෝපදේශය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය මෙම ව්‍යාපෘතිය සඳහා ලබා ගෙන තිබුණු බව තහවුරු කිරීමට අවශ්‍ය සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- මෙම ව්‍යාපෘතිය සැලැසුම් කර ඉදිකිරීම් කළ යුතු කොන්ත්‍රාත්තුවක් බැවින් (Design and Built) කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරනු ලබන සැලැසුම් හා ප්‍රමාණ පත්‍ර හොඳින් විශ්ලේෂණය කර විස්තරාත්මක අධ්‍යයනයක් සිදු කළ යුතුව තිබුණි. එවැනි අධ්‍යයනයක් සිදුකළ බව තහවුරු කිරීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අවසාන ඇස්තමේන්තුව අනුමත කර ගෙන නොතිබුණි.

- සමස්ථ ව්‍යාපෘතිය අදියර 04 කට වෙන්කර කොන්ත්‍රාත්කරුවන් 04 දෙනෙකු වෙත කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් ප්‍රදානය කළ වටිනාකම හා ඉංජිනේරු ඇස්තමේන්තු අතර ප්‍රමාණාත්මක විචලනයක් නිරීක්ෂණය විය. විශේෂයෙන්ම මහාමාර්ග අංශයේ සමාලෝචන වාර්තාව අනුව කොන්ත්‍රාත් අංක 01 කොටසේ ගලපන ලද ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 73,892.19 ක් වන අතර කොන්ත්‍රාත්කරු සමඟ එකඟ වූ වටිනාකම රු.මිලියන 103,280.00 ක් විය. ඒ අනුව කොන්ත්‍රාත් ප්‍රදානය කළ මිල රේටයන් සියයට 40 කින් වැඩි වී තිබුණි. එසේම එම අංක 01 කොටස සඳහා එකඟ වූ කොන්ත්‍රාත් වටිනාකම සමඟ දැනට ඉදිකර ඇති සමාන අධිවේගී මාර්ග 03 ක රේටයන් සමඟ සැසැඳීමේදී එකඟ වූ මිල ගණන් සියයට 14 ක සිට සියයට 95 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ඉහළ පිරිවැයකින් යුක්ත බව නිරීක්ෂණය විය.

- ඉදිරිපත් කළ ප්‍රමාණපත්‍ර අනුව මාර්ගය සඳහා කොන්ක්‍රීට් මිශ්‍රිත කණු (Concrete mixing file) තැනිය යුතු වුවද, ඒ වෙනුවට සේවායෝජකයාගේ අනුමැතියකින් තොරව ස්පන් කණු (Spun File) තැනීම සඳහා තීරණය කර තිබුණි. මෙකී කණු සඳහා උපදේශන සමාගම විසින් අනුමත කළ රේටයන් සහ වෙළඳපොලේ සාමාන්‍ය

මිල ගණන් අතර අසාමාන්‍ය විචලනයට අනුව රු.මිලියන 1,354 ක පමණ අතිරේක පිරිවැයක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට සිදුවන බව නිරීක්ෂණය විය.

- මෙම ව්‍යාපෘතියට අදාළ මූලික ඇස්තමේන්තු පිළියෙල කිරීම, මාර්ග සැලැසුම් පිළියෙල කිරීම, ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම යන ක්ෂේත්‍රවල සිදුවූ විශාල දුර්වලතා හේතුවෙන් කළින් සැලැසුම් කළ වැඩ කොටස් නැවත නැවත ප්‍රමාණාත්මකව වෙනස් කර තිබුණි. මේ අනුව ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කර සමස්ථ ව්‍යාපෘතියේ පිරිවැය ද වැඩි විය හැකි බව විගණනයේදී තවදුරටත් නිරීක්ෂණය විය.

- ඉදිකිරීම් පළමු කොටසේ (section 1) කොන්ක්‍රීට් ඉදිකිරීම්වලදී සිදු කළ යුතු කොන්ක්‍රීට්වල උෂ්ණත්වය පරීක්ෂා කිරීමේ කටයුතු නිශ්චිත හේතු නොදක්වා උපදේශක සමාගම විසින් ඉවත් කර තිබුණි. මේ නිසා එම ප්‍රමාණ පත්‍ර අයිතමයේ පිරිවැය විශ්ලේෂණය කර නොතිබීම නිසා මුළු රේටය පදනම්ව දිග මීටර් 3,042,253 ක් සඳහා රු. 445,500 බැගින් රු.මිලියන 13,553 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. මෙම පරීක්ෂණය සඳහා ප්‍රමාණපත්‍රවල ඇතුළත් සාමාන්‍ය පිරිවැය දිග මීටරයක් සඳහා රු.30,000 ක් පමණ වන බැවින් රු.මිලියන 912 ක් පමණ මුදලක් ආර්ථිකමය නොවන ආකාරයට හා පදනමකින් තොරව වැඩිපුර ගෙවා තිබුණි.

- එකී ඉදිකිරීම් කටයුතු සඳහා Grand Compaction file ක්‍රමය වඩාත් යෝග්‍ය ද යන්න පිළිබඳව කරන ලද අත්හදා බැලීමේදී එකී පරීක්ෂණය සමත් වුවහොත් පමණක් දිග මීටරයක් සඳහා රු.6,400 ක් බැගින් ගෙවීම සඳහා එකඟ වී තිබුණි. එසේවුවත් එකී පරීක්ෂණය අසමත්වී තිබියදීත් කොන්ත්‍රාත්කරුට දිග මීටර් 41,970.08 ක් සඳහා රු.මිලියන 266.61 ක් ගෙවා තිබුණු අතර ගෙවීමට පාදක වූ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- කොන්ත්‍රාත් ගිවිසුමේ දෙවන වෙළුමේ 4.2 පරිච්ඡේදයේ සඳහන් සාමාන්‍ය කොන්දේසි අනුව කාර්යසාධන බැඳුම්කරවල පිරිවැය කොන්ත්‍රාත්කරු විසින් දරා ගත යුතුය. එසේ වුවත්, එම කොන්දේසිවලට පටහැනිව කොන්ත්‍රාත්තුවේ පළමු කොටස වෙනුවෙන් රු.මිලියන 128.42 ක කාර්යසාධන බැඳුම්කර වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණි. එසේම කොන්ත්‍රාත්තුවේ 03 වන කොටසට අදාළ ප්‍රමාණපත්‍රවල කාර්යසාධන බැඳුම්කර සඳහා එකවර ගෙවන මුදලක් ලෙස (Lump sum) ඇතුළත් කර තිබුණු බැවින් රු.මිලියන 99.37 ක් ඇතුළත් කර තිබුණි.

- කොන්ත්‍රාත්තුවේ 01 කොටස සඳහා අවසර ලබා නොදෙන (Negative list) භාණ්ඩ ගණයට වැටෙන රු.මිලියන 368.71 කට සමාන එ.ජ.ඩො. 2,448,000 ක් වටිනා සිමෙන්ති තොගයක් බදු සහන පදනම යටතේ ආනයනය කිරීමට අවසර ලබා දී තිබුණි. එසේම අවසර ලබානොදෙන භාණ්ඩ ලැයිස්තුවේ ඇතුළත් වානේ කම්බිද ආනයනය කර තිබුණි.

- රේගු ආඥා පනතේ 22(ඒ) පරිච්ඡේදය යටතේ බදු සහන පදනමට ආනයනය කරන ලද උපකරණ, වාහන, යන්ත්‍ර වැනි දෑ ව්‍යාපෘතිය අවසානයේදී ප්‍රතිඅපනයනය කළ යුතු වන අතර එසේ සිදුවන බවට සහතිකවීම පිණිස ඒකාබද්ධ බැඳුම්කරයක් හෝ බැංකු බැඳුම්කරයක් හෝ භාණ්ඩාගාර බිල්පත් භාණ්ඩ නිදහස් කරන මොහොතේදී අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ලබාදිය යුතුය. එසේ කළ බවට සාක්ෂි හෝ ඒ පිළිබඳ විස්තර කිසිවක් විගණනයට ඉදිරිපත් නොකළ අතර එවැනි භාණ්ඩ පැහැදිලිව හඳුනාගැනීමේ ක්‍රමවේදයක් ද අමාත්‍යාංශය විසින් හඳුන්වාදී නොතිබුණි.

- මාතර සිට අන්දර වැව හරහා හම්බන්තොට වෙත දිවෙන මාර්ගයේ 04 වන කොටසේ කොන්ත්‍රාත් ගිවිසුම් 2013 නොවැම්බර් 19 දින අත්සන් කර තිබුණි. ඉතා ඉක්මනින් ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 2014 මැයි 21 දින ආරම්භ කර තිබුණි. එසේම 2013 නොවැම්බර් 01 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව, ඉඩම් අත්පත් කර ගැනීමේ කාලයද සති 72 ක සිට සති 26 ක් දක්වා අඩුකර තිබුණු අතර එකී කාර්යයේ නිරත නිලධාරීන් සඳහා රු.මිලියන 30.56 ක දිරිදීමනාවක් හා එම කටයුත්ත සඳහා වෙනම බඳවාගත් උපදේශකයින් 13 දෙනෙකු සඳහා රු.මිලියන 19.01 ක දීමනාවක්ද ගෙවා තිබුණි. එසේවුවද, කොන්ත්‍රාත්තුවේ 4 වන කොටසට අදාළව මහවැලි අධිකාරියෙන් අත්පත් කරගත් ඉඩමක කළුගල් කඩා ඉවත් කරගැනීම නිසා දළ වශයෙන් මීටර් 40 ක් දිග හා මීටර් 30 ගැඹුරු වළක් ඇති වී තිබුණි. මෙම වළ පිරවීම සඳහා රු.මිලියන 386.66 ක් වැය කළ යුතු බවට ඇස්තමේන්තු කර එය අනුමත කර තිබුණු නමුත්, එම මුදල ව්‍යාපෘතියට අතිරේක පිරිවැයක් වන බැවින් එම වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**(xii) දක්ෂිණ අධිවේගී දිගුව සඳහා වන උපදේශන සේවය**

**-----------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සහ සැලසුම් අධීක්ෂණය සඳහා වන ගිවිසුම් 2014 දෙසැම්බර් 03 දින මාර්ග සංවර්ධන අධිකාරිය සහ China Railway First Survey and Design සමාගම සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණි. එසේ වුවත්, උපදේශක සමාගම තෝරාගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුව සිදු කර නොතිබුණි.

- ව්‍යාපෘතිය ආරම්භයේදී ඉදිකිරීම අධීක්ෂණ කටයුතු මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය (CECB) වෙත පවරා තිබුණි. ඒ සඳහා වූ ගිවිසුම් අනුව ව්‍යාපෘතියේ කටයුතු 2014 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කර 2015 සැප්තැම්බර් මාසය වන විට අවසන් කර තිබුණි. මේ සඳහා රු.මිලියන 24.84 ක් CECB වෙත ගෙවා තිබුණි. එම ආයතනය විසින් ඉටුකළ කාර්යයන්ට අදාළ ලිපිගොනු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- උපදේශක සමාගම විසින් ඉදිරිපත් කරන ලද ඉන්වොයිස් පත්‍රයට අනුව රු.මිලියන 1,083.97 ක් වටිනා වැඩ කොටස්වලට අදාළව බිල් කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට ඉන්වොයිස් වටිනාකමින් රු.මිලියන 188.94 ක වැඩ කොටස් පමණක් ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් අනුමත කර තිබුණි. ගෙවීම් සඳහා අරමුදල් සම්පාදනය පිණිස ණය ගිවිසුමක් අත්සන් කර නොතිබුණු නිසා ගෙවීම් කිරීම ප්‍රමාද වීම මත පමා පොළී ගෙවීමට සිදුවිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

- ගිවිසුමේ 4.1 වගන්තියේ සඳහන් සාමාන්‍ය කොන්දේසිය යටතේ සේවායෝජක විසින් අනුමත කර තිබුණු කාර්ය මණ්ඩලය බඳවාගෙන උපදේශක සේවා සැපයිය යුතු වුවත්, ගිවිසුම් අනුව බඳවා ගත යුතු සේවකයින් සහ තථ්‍ය වශයෙන් සේවය

කරන සේවක ප්‍රමාණය අතර වෙනස්කම් නිරීක්ෂණය විය. දේශීය සේවකයින් සහ විදේශීය සේවකයින් සඳහා පිළිවෙලින් රු.මිලියන 1,662.46 ක් හා රු.මිලියන 5,832.07 ක් වශයෙන් ගෙවීම කිරීම සඳහා එකඟවී තිබුණි. එබැවින් වඩා ඉහළ පලපුරුද්දක් ඇති සුදුසුකම් ලත් නිලධාරීන් විනිවිදභාවයෙන් යුතුව බඳවා ගෙන තිබුණු බව තහවුරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එම තනතුරුවලට බඳවාගෙන තිබුණු නිලධාරීන්ගේ සුදුසුකම් පරීක්ෂාකිරීම සඳහා අවශ්‍ය වන සහතික පත් සහ අනෙකුත් ලිපි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- උපදේශක සමාගම විසින් පිරිවැය ඇස්තමේන්තුවල දක්වා තිබුණු වැටුප් රේටයන්ට වඩා ඉතා පහළ වැටුප් රේටයක් එහි නිලධාරීන්ට ගෙවා තිබුණි. උදාහරණ වශයෙන් විදේශීය නේවාසික ඉංජිනේරුවරයෙකු සඳහා එ.ජ.ඩො.28,000 ක් ගෙවීමට ඇස්තමේන්තු කර තිබුණද, සත්‍ය වශයෙන් එ.ජ.ඩො. 12,500 ක් පමණක් ගෙවා තිබුණි. මෙම තත්ත්වය නිලධාරීන්ගේ රැකියාවට ඇති කැපවීම අඩු කරවන අතර අධීක්ෂණ කටයුතුවල ගුණත්වය කෙරෙහිද අහිතකර ලෙස බලපා තිබුණු බව නිරීක්ෂණය විය.

- ලංකාවේ ව්‍යාපෘතියක සේවය කිරීම සඳහා විදේශීය පුද්ගලයින් විසින් නේවාසික වීසා (Resident Visa) ලබා ගත යුතු වුවත්, ආගමන විගමන නීතිවලට පටහැනිව සංචාරක වීසා ලබාගෙන මෙරටට පැමිණි පුද්ගලයන් සේවයේ යොදවා තිබුණු බව නිරීක්ෂණය විය. මේ නිසා සේවකයින් නිතර නිතර රටට පැමිණීම සහ රටින් පිටවීම ව්‍යාපෘතියේ කටයුතුවලට අහිතකර ආකාරයෙන් බලපාන බව විගණනයේදී නිරීක්ෂණය විය.

- වෙනත් ආයතනවල සේවය කිරීම සඳහා පැමිණ සිටින විදේශිකයින්ද මෙම ව්‍යාපෘතිය යටතේ සේවා නියුක්තව සිටින බව තවදුරටත් නිරීක්ෂණය විය.

- උපදේශක ගිවිසුමේ 1.4 වගන්තියේ සඳහන් සාමාන්‍ය කොන්දේසිය යටතේ ව්‍යාපෘති කටයුතු සිදු කළ යුතු භාෂාව ඉංග්‍රීසි භාෂාව වී තිබුණි. නමුත් ඉංග්‍රීසි භාෂා කුසලතාවය නොමැති ඉහළ මට්ටමේ නිලධාරීන් සේවා නියුක්තව සිටින බවත්, සේවා නියුක්තව ඇති භාෂා පරිවර්තකයින්ට ඉංජිනේරු දැනුම නොමැති බවත්, කරන ලද සම්මුඛ පරීක්ෂණයේදී තහවුරු විය.

- ව්‍යාපෘති කටයුතු සහ ලිපිගොනු වඩාත් නිවැරදි සහ පහසුවෙන් හඳුනා ගැනීමට හැකි වන ආකාරයට සේවකයින් සේවා නියුක්ත කරවීම මඟින් සැලැසුම් සහ ප්‍රමාණ පත්‍ර නිසි පරිදි විශ්ලේෂණය කර පමාවකින් තොරව ව්‍යාපෘති කටයුතු ඉටු කළ හැකිව තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

**(xiii) දක්ෂිණ අධිවේගී මාර්ග දිගුවේ පාදිකාව (Pavement) සැලැසුම් කිරිම.**

**---------------------------------------------------------------------------**

සමස්ථ අධිවේගි මාර්ගයේ පාදිකාව වාහන වර්ගීකරණ පංතිය අනුව සැලැසුම් කිරිම කළ යුතුව තිබුණත්, පිරිවිතරයන්ට අනුකූල නොවන පරිදි එම වැඩ කොටස් සැලැසුම් කිරිම නිසා ව්‍යාපෘතිය වෙනුවෙන් සිදුවිය හැකි අතිරේක පිරිවැය රු.බිලියන 01 ක සිට රු.බිලියන 02 ත් අතර පරාසයක ප්‍රමාණයක් විය හැකි බව විගණනයේදී තහවුරු විය. එසේම පාදිකා සැලැසුම් කිරීම සඳහා සුදුසුකම් සහිත පළපුරුදු නිලධාරින් බඳවා ගත යුතු වුවද ,ඒ සඳහා සුදුසුකම් ඇති නිලධාරීන් යොදවා නොතිබුණි.

**(xiv) මහාමාර්ග අංශයේ වැඩ සටහනක් සැලැසුම් කිරීම, අයවැය කටයුතු සහ අධීක්ෂණ කටයුතු සඳහා උපදේශකයකු බඳවා ගැනීම.**

**---------------------------------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ව්‍යපෘතිය සඳහා උපදේශකයන් බඳවා ගැනීමේ පරිපාටියට පටහැනිව හා අයදුම් පත්‍ර කැඳවීමකින් තොරව අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු වෙත ඉදිරිපත් කර තිබුණු ජීව දත්ත ලේඛන (Bio data) 03 ක් මත බඳවා ගැනීම සිදුකර තිබුණි. ජීව දත්ත ලේඛනවල (Bio data) සඳහන්ව තිබු දිනය, බඳවා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ දැනුවත් කර තිබුණු ලිපියට ප්‍රථම දිනයක් වූ අතර ජීව දත්ත වාර්තා දෙකක් දින රහිතව ඉදිරිපත් කර තිබුණි. උපදේශකවරයෙකු බඳවා ගැනීම, සම්මුඛ පරික්ෂණ මණ්ඩලයක් මඟින් සිදු කළ යුතුව තිබුණත්, එම බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත්කළ බව තහවුරු කිරීමේ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- දක්ෂිණ අධිවේගි මාර්ගයේ තෙවන කොටසට (Section 03) අදාළ බිල්පත්වලට උපදේශකවරයාගේ දීමනා ඇතුළත් කර ගෙවීමේ පදනම මත උපදේශකවරයා බඳවා ගෙන තිබුණි. එසේ වුවත්, එම ගෙවීම සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

- 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට පමණක් වාහනයක් සහ රියැදුරකු අනුයුක්ත කළ හැකිව තිබුණි. නමුත් එම බඳවා ගැනීම සම්බන්ධයෙන් වූ ප්‍රසම්පාදන කමිටුව විසින් රු.15,000 ක දෛනික දීමනාවක් සමඟ වාහනයක් සහ රියැදුරකු මෙම තනතුර සඳහා ලබා දී තිබුණි. නමුත් දෛනිකව රු.15,000 ක දීමනා ගෙවීම අනුමත කිරීමේ පදනම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. 2017 වර්ෂයේ ජුලි මාසය දක්වා එකතුව රු.මිලියන 3.53 ක දීමනා අනුමත කර තිබුණු අතර එම දීමනාවලින් රු.585,500 ක උපයන විට බදු අඩු කර නොගෙන ව්‍යාපෘතිය විසින් එම බදු ගෙවා තිබුණි.

- දක්ෂිණ අධිවේගී මාර්ග දිගුවේ වැඩ සටහන් සැලැසුම් කිරීම, අයවැයකරණය හා ව්‍යාපෘති කටයුතු අධීක්ෂණය සඳහා මෙම උපදේශක තනතුර ඇති කර ගෙන තිබුණි. ව්‍යාපෘති අධීක්ෂණ කමිටු රැස්වීම් කිසිවකටත් එම උපදේශකවරයා සහභාගී වී නොතිබුණි. නමුත් එම උපදේශකවරයා වෙනත් ව්‍යාපෘති සඳහා සේවය සපයන බව විගණනයේදී නිරීක්ෂණය විය.

**3.10 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**----------------------------------------------------------**

**ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්**

**----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොළඹ තදාසන්න ප්‍රදේශයේ රථ වාහන කළමනාකරණ ව්‍යාපෘතිය (Traffic Management in Greater Colombo Area) සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රු. මිලියන 25 ක ප්‍රතිපාදන සලසා තිබුණත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. පසුගිය වර්ෂයේද මෙම කාර්යය සඳහා ප්‍රතිපාදන ලබාදී තිබුණි.

(ආ) ගුවන් අධිවේගී මාර්ග ආයෝජන ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන (Expressway Elivated Highways Investment Project) සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් රු.මිලියන 24 ක ප්‍රතිපාදන සලසා තිබුණද, 2016 වර්ෂය අවසාන වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

**3.11 සැපයුම් නොකළ භාණ්ඩ හා සේවා සඳහා මුදල් ගෙවීම්**

**----------------------------------------------------------**

දක්ෂිණ අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට අයත් නොවන ග්‍රාමීය මාර්ග ඉදිකිරීමේ කටයුතු සඳහා විධිමත් ගිවිසුමකින් හා විධිමත් වැඩසටහනකින් තොරව දක්ෂිණ අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ ඉතිරි වී තිබුණු රු.මිලියන 1,570 ක් ව්‍යාපෘතියට සම්බන්ධතාවයක් නොතිබුණු සමාගමක් වෙත අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. එම අත්තිකාරම් වෙනුවෙන් ලබා දී තිබුණු අත්තිකාරම් බැඳුම්කරයේ කාලයද 2016 දෙසැම්බර් 31 දින අවසන් වී තිබුණු අතර 2017 නොවැම්බර් 30 දින වන විටත් එම අත්තිකාරම්වලින් රු.මිලියන 70 ක් අය කර ගෙන නොතිබුණි.

**3.12 මතභේදයට තුඩුදෙන කරුණු**

**-------------------------------**

ශ්‍රී ලංකා රජයේ ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ පකිස්ථාන සිසුන් දෙදෙනෙකුට SAITM වෛද්‍ය උපාධි පාඨමාලා සඳහා ගෙවීම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** ශ්‍රී ලංකා රජයේ ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ පේරාදෙණිය කෘෂිකර්ම පීඨයේ BSC Animal science සහ Agricultural Technology and Management යන පාඨමාලා සඳහා පකිස්ථාන සිසුන් දෙදෙනෙකු ලියාපදිංචි වී තිබුණි. පසුව රාජ්‍ය නොවන උපාධි ප්‍රදාන ආයතනයක් වූ South Asian Institute of Technology and Medicine (Pvt) Ltd (SAITM) හි වෛද්‍ය උපාධි පාඨමාලාව සඳහා එම සිසුන් ලියාපදිංචි කරවීමට 2013 වර්ෂයේදී උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කටයුතු කර තිබුණි. මෙම සිසුන් දෙදෙනා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග

අමාත්‍යාංශය විසින් SAITM ආයතනය වෙත 2017 ජූනි මාසය දක්වා මාසික ශිෂ්‍යත්ව ගෙවා තිබුණි. නමුත් ඒ සඳහා වූ විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ)** මෙම ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය යටතේ විවිධ පාඨමාලාවන් සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල ලියාපදිංචි වන විදේශීය සිසුන් අදාළ පාඨමාලා සම්පූර්ණ නොකර රට හැර ගිය අවස්ථා පසුගිය අධ්‍යයන වර්ෂ 04 කදී අනාවරණය විය. ඒ අනුව 2012/2013 අධ්‍යයන වර්ෂයේ සිට 2015/2016 වර්ෂය දක්වා වර්ෂ 04 ක් තුළ පිළිවෙලින් සියයට 26, 16, 26 හා 04 ක් වශයෙන් රට හැර ගොස් තිබුණි. ඒ අනුව සිසුන් 04 දෙනෙකු 2012/2013 අධ්‍යයන වර්ෂයේදී පාඨමාලා හැර ගොස් තිබූ අතර ඔවුන් වෙනුවෙන් රු.1,735,000 ක් අමාත්‍යාංශය විසින් වැය කර තිබුණි. එම වියදම ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර එම සිසුන් වෙනුවෙන් විශ්වවිද්‍යාල වෙත ගෙවා තිබුණු රු.330,000 ක් නැවත අමාත්‍යාංශය වෙත ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.13 අවිධිමත් ගනුදෙනු**

**--------------------**

මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන ප්‍රාදේශීය මාර්ග (Non RDA Roads) පුළුල් කිරීමේ හා වැඩි දියුණු කිරීම සඳහා 2016 වර්ෂයේදී හා 2017 අගෝස්තු මාසය දක්වා පිළිවෙලින් රු.මිලියන 1,868 ක් හා රු.මිලියන 1,795 ක් වැයකර තිබුණි. නමුත් මෙම ව්‍යාපෘති වෙනුවෙන් සිදුකරනු ලබන වියදම් පියවාගැනීම සඳහා භාණ්ඩාගාරය වෙතින් ප්‍රතිපාදන අනුමත කරවාගෙන නොතිබුණි. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග පුළුල්කිරීමේ හා වැඩි දියුණු කිරීමේ කාර්යයන් සඳහා ලබාගෙන තිබුණු ප්‍රතිපාදන මේ සඳහා උපයෝජනය කර තිබුණි.

**3.14 කාර්යසාධනය**

**------------------**

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණයක් පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

**---------------------------------------------------**

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) 2005 ඔක්තෝබර් 26 දින අමාත්‍ය මණ්ඩලයේ තීරණය ප්‍රකාරව 2006 ජනවාරි මාසයේ සිට බල පැවැත්වෙන පරිදි පෙට්‍රල් හා ඩීසල් අලෙවි කිරීමෙන් රජයට ලැබෙන ආදායමෙන් පෙට්‍රල් ලීටරයකින් රු.1/- ක් ද, ඩීසල් ලීටරයකින් ශත 50 ක්ද, බැගින් මාර්ග සංවර්ධන අරමුදලට බැර වන සේ රජය විසින් ප්‍රතිපාදන සලසා දිය යුතුව තිබුණි. කෙසේ වුවද, එම යෝජනාව 2016 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී එසේ අලෙවි කරන ලද පෙට්‍රල් හා ඩීසල් වෙනුවෙන් මාර්ග සංවර්ධන අරමුදල සඳහා බැර විය යුතු සෙස් බද්ධ රු.මිලියන 2,413.86 ක් විය. අමාත්‍යාංශයේ කාර්යයන් දැක්වීමේදී “මාර්ග සංවර්ධන අරමුදලක් ඇති කිරීම “ යන කාර්යය වෙනුවෙන් අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශයේ 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව මහ නැගුම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

යටතේ රු.මිලියන 1,000 ක ප්‍රතිපාදන උපයෝජනය කරමින් ග්‍රාමීය මාර්ග කිලෝ මීටර් 193.9 ක් දුර ප්‍රමාණයක් සංවර්ධනය කිරිමට සැලැසුම් කර තිබුණි. 2016 වර්ෂය අවසාන වන විට මහ නැගුම මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවට අනුව රු.මිලියන 364.3 ක ප්‍රතිපාදන ලැබී තිබුණත්, ඉන් රු.මිලියන 293.8 ක් උපයෝජනය කර තිබුණි. මේ අතර කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කර තිබුණු මාර්ග කිලෝ මීටර් 33.33 ක් වී තිබුණි. මේ අනුව ඉලක්කගත ප්‍රතිපාදනයෙන් සියයට 36 ක් ලැබී තිබුණද, එහි භෞතික ප්‍රගතිය සියයට 20 ක් පමණක් වී තිබුණි.

(ඇ) අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන් අතර පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට අයත් මාර්ග පිළිබඳ ජාතික ප්‍රතිපත්ති පදනම් කර ගෙන වැඩසටහන් හා ව්‍යාපෘති සකස් කිරීම, එම වැඩසටහන් සහ ව්‍යාපෘති සම්බන්ධිකරණය හා මෙහෙයවීම සිදු විය යුතුව තිබුණි. නමුත් ඒ සම්බන්ධයෙන් කිසිම ක්‍රියාකාරකමක් අමාත්‍යාංශය විසින් සිදු කර නොතිබුණු බව අනාවරණය විය.

## 3.15 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**(අ) මහාමාර්ග අංශය**

මහාමාර්ග අංශයේ 2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 28 | 22 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 370 | 269 | 101 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 38 | 28 | 10 |
| (v) | වෙනත්(අනියම්/ තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 04 | 01 | 03 |
| | **එකතුව** | **443** | **322** | **121** |

**(ආ)** **උසස් අධ්‍යාපන අංශය**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 24 | 20 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 02 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 132 | 84 | 48 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 45 | 25 | 20 |
| | **එකතුව** | **205** | **131** | **74** |

**(ඇ)** **අවිධිමත් ලෙස ලබාගත් මානව සම්පත්**

2015 හා 2016 වර්ෂවලදී මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය පිළිවෙලින් 260 දෙනෙකු හා 48 දෙනෙකු අමාත්‍යාංශය වෙත මුදා හැර තිබුණි. එම කාර්ය මණ්ඩලය වෙනුවෙන් වැටුප් වශයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් එකතුව රු.මිලියන 40.59 ක් ගෙවා තිබුණි. අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය අමාත්‍යාංශය වෙත ලබා ගෙන තිබුණු අතර, අධිකාරිය විසින් ගෙවා තිබුණු වැටුප් අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කිරීමට හෝ අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**(ඈ)** **අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවයන් | මුදාහැර තිබූ කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| සංවර්ධන සහකාර | 01 | කෑගල්ල ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය | 2015 පෙබරවාරි 02 දින සිට 2017 දෙසැම්බර් 12 දින දක්වා |
| සංවර්ධන නිලධාරි | 159 | මාර්ග සංවර්ධන අධිකාරිය | 2013 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 12 දින දක්වා |